ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 28/10/21

| | | | |
|---|---|---|---|
| පැමිණිලිකාරිය | : | | ඩබ්. අයි. මිහිරාණි මිය, මරදාන, අහුංගල්ල. |
| වින්දිත පාර්ශවය | : | 01. | වර්ණකුලගේ අමිල දුෂාන්ත මයා |
| | | 02. | පිටිගල ලියනගේ වාමා ක්‍රිෂාන්ති මිය |
| වගඋත්තරකරු/වන් | : | 01. | ප්‍ර.පො. ප. මහින්ද විල්ලෝරආරච්චි මයා, පොලිස් ස්ථානය , අම්බලන්ගොඩ. |
| | | 02. | උ. පො. උ. පො. බාලේන්ද්‍ර මයා, ස්ථානාධිපති, අපරාධ අංශය, පොලිස් ස්ථානය , අම්බලන්ගොඩ. |
| | | 03. | උ. පො. ප. මධුරංග මයා, පොලිස් ස්ථානය , අම්බලන්ගොඩ. |
| | | 04. | පො. කො. 72995 තරංග මයා, පොලිස් ස්ථානය , අම්බලන්ගොඩ. |
| | | 05. | පො. කො. 3011 රංගන මයා, පොලිස් ස්ථානය, අම්බලන්ගොඩ. |
| | | 06. | පො. කො. 69864 සඳරුවන් මයා, පොලිස් ස්ථානය, අම්බලන්ගොඩ. |

පැමිණිලි අංකය : HRC/3447/16

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

- 2016.08.26 දින තම සහෝදරයකු වන වර්ණකුලගේ අමිල දූශාන්ත යන අය හා තමාගේ ඥාති සහෝදරියක වන වාමා ශ්‍රී කාන්ති යන අය වගඋත්තරකරුවන් විසින් රැගෙන ගිය බවත්, තම සහෝදරිය දින 03ක් පොලිස් ස්ථානයේ රඳවා ගත් බවත්, තම සහෝදරයා 2016.09.13 දින දක්වා නීතිවිරෝධීව රඳවා තබා ගෙන, අත්බෝම්බයක් ළඟ තබා ගැනීම යන්න දක්වා අධිකරණයට ඉදිරිපත් කර බන්ධනාගාරගත කළ බවත්,

- තවද දින 19 ක් නීතිවිරෝධීව රඳවා ගෙන වධහිංසාවට ලක් කළ බවට වැඩිදුරටත් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

වින්දිතගේ ප්‍රකාශය :

වර්ණකුලගේ අමිල දූශාන්ත මයා

- 2016.08.26 දින තමා සහ තමාගේ සහෝදරියක වන වාමා ශ්‍රී කාන්ති යන අය සමඟ තම යතුරුපැදියෙන් ලංකා බැංකුවට මුදල් ගැනීමට ගිය බවත්, එහිදී පුද්ගලයන් කිපදෙනෙකු "තමුසේ" කියා පැමිණ තමා අල්ලා ගත් බවත්, එයින් එක් අයකු අම්බලන්ගොඩ පොලිස් ස්ථානයෙන් පොලිස් නිලධාරී සඳරුවන් මහතා බව හඳුන ගත් බවත්, අල්ලා ගැනීමට හේතුව විමසීමේදී "නෑ මේ පොඩි වැඩකට පොඩ්ඩක් හිටපන්" යැයි කියූ බවත්, ඒ අවස්ථාවේ ඉහත සහෝදරියගේ මිතුරෙකු වන ප්‍රගීත් ඔහුගේ යතුරුපැදියෙන් එම ස්ථානයෙන් ගිය බවත්, "ඔහු මොකද කරන්නේ යැයි" විමසූවිට සඳරුවන් නිලධාරී ඔහුට කථා කර බැංකුව පිටුපසට ගෙන ගොස් පැය 02 ක් රඳවා ගෙන සිටි බවත්, එහිදී නිවසට පණිවිඩයක් ලබා දීමට අවශ්‍ය බව කිව්වද ඒ සඳහා අවස්ථාවක් ලබා නොදුන් බවත්,

- පසුව මෙසේ රඳවා සිටියදී බැංකුවේ ආරක්ෂක අංශය මඟින් බුලත්සිංහල පොලිස් ස්ථානයට දැනුම් දුන් බවත්, පොලිස් නිලධාරීන් පැමිණ විට ඔවුන් තමා රැගෙන යාමට පැමිණි බවට දැන්වීමෙන් පසු ඔවුන් ගිය බවත්,

- පසුව සඳරුවන් නිලධාරී " වැඩේ හරි සර් ජීප් එක එවන්න" යැයි දුරකථන ඇමතුම් දුන් බවත්, එවිට එම ස්ථානයට ජීප් රථ දෙකකින් නිලධාරීන් 15 දෙනෙකු පමණ තමාත්, සහෝදරිය හා ප්‍රගීත් යන අයවළුන් ජීප් රථයෙන් ගෙන ගිය බවත්,

- තමාගේ හිසට හෙල්මට් එකක් දමා තමාගේ දෑස බැඳ ජීප් රිය පිටුපස තමාව එබූ බවත්, ප්‍රගීත්ව හා තම සහෝදරියව වාහනයේ ඉන්දවා ගෙන ගිය බවත්, පසුව තමාව නිවසකට ගෙන ගිය බවත්, එහිදී

තමා අම්බලන්ගොඩ පොලීසියේ ලොකු මහත්තයා සිටිනවා දුටු බවත්, තවත් සුදු සාමාන්‍යයෙන් උස නැති මහත කොන්ඩේ කොටට කැපූ පුද්ගලයකු හා සඳරුවන් නිලධාරී ඇතුළු පිරිසක් එහි සිටි බවත්,

- එහිදී තමාගෙන් අරලිය හෝටලේ මුදලාලිට වෙඩි තැබීම පිළිබඳ විමසූ බවත්, තමා නොදන්නා බව කිවූ නමුත්, එහිදී මූලස්ථාන පොලිස් පරීක්ෂක තමාට පයින් පහරක් ගැසූ බවත්, තමා උඩින් විසිවී ගොස් වැටුණු බවත්, පසුව " මූට ඕන දෙයක් කරපල්ලා" යැයි පවසා සිටි ඔහු පිටව ගිය බවත්, තමාගේ අත්වලට හා පාදවලට මාංචු දැමූ බවත්,

- පසුදින තමාගෙන් ප්‍රශ්න කළ බවත්, පසුදින තමාගේ ඇස් බැඳ නැවත ගෙන ආ බවත්, එහිදී තමා ගෙන ආවේ තිලකපුර පොලිස් මුරපොලට බව පසුව දැනගත් බවත්, එදින රාත්‍රී නිලධාරීන් අටදෙනෙක් සහ දහදෙනෙක් පමණ ආරක්කු පානය කළ බවත්, ඔළුවට පිස්තෝලය තමා මරණ බවට තර්ජනය කර, දින 4 – 5 ක් තමාගෙන් ප්‍රශ්න කර, පසුදින උ.පො. ප. බාලේන්ද්‍රන් තමාගෙන් ප්‍රශ්න කළ බවත්, පසුව තමාගේ කළිසම ගලවා නිරුවත් කර, ඇස් බැඳ විනාඩි 10 – 15 ක් උඩ පැනීමට දන්වා, පසුව කකුල් වලට මාංචු දමා තමා බිම නිදි කරමින් නිලධාරීන් කීපදෙනෙකු තමාගේ කකුල උඩ හා පපුව උඩත් නැග සිටි අතර, තව නිලධාරියකු තමාගේ ඔළුව අල්ලා සිටි බවත්, පසුව තමාගේ යටි පතුල්වලට පොලු පහරවල් 40 ක් පමණ ගැසූ බවත් නැවත තමාගෙන් ප්‍රශ්න අසා නැවත පොලු පහරවල් 20 ක් ගැසූ බව වැඩිදුරටත් දක්වා ඇත.

- එසේම, තමාගේ ඇස් බඳින ලද රෙදි කැල්ල ඉවත් කර ඇස්වලට කොච්චි දමා, ඊටපසුව බෝතලේකට කොච්චි යුෂ යෙදූ බෝතලයක් තමාගේ ගුද මාර්ගයට ඇතුල් කළ බවත්, තමා සමඟ තවත් සැකකරුවකු වන රමේශ් නැමැත්තාද සිටි බව දක්වයි.

- පසුව දින 19කට පසුව තමාව අම්බලන්ගොඩ පොලීසියට රැගෙන ගිය බවත්, පසුදින තමාව අධිකරණයට ඉදිරිපත් කළ බවත්, අධිකරණයට ගෙන යාමට පෙර තමාව බලපිටිය රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යොමු කළ නමුත්, ඔහු තමාගේ රෝගී තත්ත්වයන් කිසිවක් සටහන් නොකළ බව දක්වා සිටී.

<u>දෙවන වින්දිතගේ ප්‍රකාශය :</u>

2016.08.26 දින පලවන වින්දිත දැක්වූ පරිදි ලංකා බැංකුව වෙත යාමේදී තමාව හා තම සහෝදරයාව අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට ගෙන ගිය බවත්, තමාගේ මිතුරියකගේ ස්වාමිපුරුෂයෙකුද ගෙන ගිය බවත්, තමාගේ නිවසට පණිවිඩයක් ලබාදීමට දැනුම් දුන්නද , දැනුම් නොදුන් බවත්, පොලිස් ස්ථානයට රාත්‍රී ගෙන ආ නමුත්, කිසිදු කාන්තා නිලධාරිණියක් නොසිටි බවත්, දින තුනක් තමාගේ ඇස් ගැට ගසා රඳවා ගත් තමාව තුන්වන දින නිදහස් කළ බවත් දක්වා ඇත.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

<u>මූලස්ථාන පොලිස් පරීක්ෂක :</u>

- තම පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කළ උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරී විසින් 2016.09.13 දින විදේශයක නිෂ්පාදිත ජීව අත්බෝම්බයක් සන්තකයේ තබා ගැනීමේ වරදට අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කළ බවත්,

- 2016.09.05 දින කිසිදු විටක තම නිලධාරීන් වින්දිතයන් අත්අඩංගුවට නොගත් බවත්,

- 2016.09.03 දින තංගල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති අම්බලන්ගොඩ පොලිස් ස්ථානයෙන් කුමන සැකකරුවෙකු සම්බන්ධයෙන් කෙසේ විමසීම් කළාද යන්න තමා නොදන්නා බවත්,

- මෙම පුද්ගලයාට පොලිස් වසමේ තිලකපුර පොලිස් මුර පොලක් පවත්වාගෙන යනු ලබන අතර, එහි අපරාධ විමර්ශන කිසිවක් සිදු නොකරන අතර, අපරාධවලට සම්බන්ධ සැකකරුවන් කිසිවකු රඳවා තැබීමක් හෝ අත්අඩංගුවට ගැනීමක් සිදු නොකරන බවත් දක්වා ඇත.

නිරීක්ෂණ :-

- 2016.09.05 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලිකාරිය විසින් තම සහෝදරයා වන වින්දිත තැනැත්තාව හා තම සහෝදරිය 2016.08.26 දින අත්අඩංගුවට ගෙන පැමිණිලි කරන දිනය තෙක් රඳවා ගෙන ඇති බව පැමිණිලි කර ඇත.

- එදිනම එනම් 2016.09.05 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කාර්ය භාර්ය නිලධාරී විසින් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට අමතා ඇති අතර, පොලිස් නිලධාරීන් එවැනි සැකකරුවෙකු සිර මැදිරියේ නොමැති බව දක්වා ඇත. පසුව අදාළ කාර්ය භාර නිලධාරී, නියෝජ්‍ය පොලිස්පති දකුණ සී. එච්. කේ. ජයලත් මහතා වෙත මේ පිළිබඳ දුරකථනයෙන් විමසීමේදී, මිනීමැරුමකට සැකපිට අත්අඩංගුවට ගෙන ඇති බවට කරුණු තහවුරු කළ බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිලධාරී විසින් සටහන් යොදා ඇති බව අදාළ ක්ෂණික දුරකථන ඇමතුම් ලේඛනය පරීක්ෂා කිරීමේදී කරුණු නිරීක්ෂණය වේ.

- වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම අනුව වින්දිත 2016.09.13 දිනැතිව අම්බලන්ගොඩ වැල්ලවත්ත අයිඩීඑජ් හෝටලය අසලදී අත්බෝම්බයක් සමඟ අත්අඩංගුවට ගත් බවට කරුණු දක්වා ඇති අතර, ලේඛනද ඉදිරිපත් කර ඇත.

- පැමිණිලි පාර්ශවයට අනුව 2016.09.05 වන දින අත්අඩංගුවට ගැනීමේදී ඔවුන් සමඟ ප්‍රගීත් සුසංග

යන අයද අත්අඩංගුවට රැගෙන ආ බව දක්වා ඇත.

- ඒ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේදී ප්‍රගීත් සුසංගගේ ඥාති අයකු වන තුෂාරි නීෂා විසින් බුලත්සිංහල පොලිස් ස්ථානයේ, 2016.08.26 දින සිට ප්‍රගීත් සුසංග අතුරුදහන් බවට පැමිණිල්ලක් කර ඇති බව ලේඛන අනුව තහවුරු වේ. පසුව බුලත්සිංහල පොලිස් ස්ථානය 2016.09.08 දින 316/102 තොරතුරු පොතට අදාළව ප්‍රගීත් සුසංග 2016.09.01 දින අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ සිට සොයා ගත් බැවින් පැමිණිල්ල ඉල්ලා අස් කර ගන්නා බවට සටහන් යොදා ඇති බව ලේඛන අනුව නිරීක්ෂණය වේ.

- එසේම, වින්දිත හා අත්අඩංගුවට ගත් තැනැත්තිය වන වාමා ශ්‍රී කාන්ති දින තුනක් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ රඳවා ගෙන සිටි බවට ඇයගේ පුතා විසින් ඇසින් දුටු සාක්ෂි ලබා දී ඇත.

- 2 සහ 7 වගඋත්තරකාර පාර්ශවය අත්අඩංගුවට ගැනීමට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී ලබා දී ඇති බව ප්‍රකාශ සැලකීමේදී පරස්පර ප්‍රකාශ ලබා දී ඇති ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කිරීමේදී නිරීක්ෂණය වේ. එහිදී 2016.09.13 සිදු කළ අත්අඩංගුවට ගැනීමේදී අත්අඩංගුවට ගත් වර්ණකුලගේ සම්පත් දුෂාන්ත පුද්ගලයා මුලින්ම සඳරුවන් නිලධාරියා හඳුනා ගත් බවත්, ඒ අනුව අත්අඩංගුවට ගත් බව, අනිකුත් සහභාගි වූ නිලධාරීන් ප්‍රකාශ සිදු කළද සඳරුවන් නිලධාරී ඔහුගේ ප්‍රකාශයේ දක්වා සිටිනුයේ අත්අඩංගුවට ගත් පසු ඔහු හඳුනාගත් බවයි. ඒ අනුව මිනීමැරුමට සැකපිට මෙම වින්දිත අත්අඩංගුවට ගැනීමට නියමිතව සිටි බවට වගඋත්තර පාර්ශවයන් මානව හිමිකම් කොමිෂන් සභාවේදී ප්‍රකාශ ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

- ඒ අනුව මෙම සිදුවීමට අදාළව ඉහත කරුණු සලකා බැලීමේදී වින්දිත 2016.08.26 දිනැතිව අත්අඩංගුවට ගෙන නීතිවිරෝධී ලෙස 2016.09.13 දින තෙක් රඳවා සිටි බවට කරුණු නිරීක්ෂණය වේ.

- එසේම, වගඋත්තර පාර්ශවයේ ප්‍රකාශ මගින් වින්දිත මිනීමැරුමක සැකපිට අත්අඩංගුවට ගත් බවට කරුණු තහවුරු වුවද, පසුව අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමේදී බෝම්බයක් ළඟ තබා ගැනීම පිළිබඳ ඉදිරිපත් කර ඇති බව කරුණු නිරීක්ෂණය වේ.

- එසේම, වගඋත්තරකරුවන්ගේ පරස්පර ප්‍රකාශ කිරීම තුළින් බෝම්බ ළඟ තබා ගැනීම නිර්මාණය කරන ලද අත්අඩංගුවට ගැනීමක් බව අවධානයට ලක් වේ.

- වින්දිත විසින් දක්වා සිටිනුයේ 2016.08.26 දින සිට 2016.09.13 දින තෙක් තමා තිලකපුර, මුරපොලේ රඳවා තබා ගනිමින් ඇස් බැඳ ඇස්වලට කොච්චි දමා ගුද මාර්ගයට බෝතලයක් යොමු කර කොච්චි දියර දැමූ බවත්, එසේම, තමාව නිදි කරවා තමාගේ යටි පතුල් වලට පහර දුන් බවත්,

නිරන්තරයෙන් මිනීමැරුමක් පිළිබඳව දිගින් දිගට විමසීම් කළ බව දක්වා ඇත. එහිදී තමාට පහර දුන් නිලධාරීන් ලෙස පසුව ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයකින් පහත නිලධාරීන් වන බව දක්වා ඇත. උ. පො. ප. බාලේන්ද්‍ර, උ. පො. ප. මධුරංග, උ. පො. ප. කරුණාරත්න, උ. පො. ප. සමීර, පො. කො. ප්‍රේමතිලක හා පො. කො. ධනුෂ්ක, පො. කො. සඳරුවන් හා පො. කො. තරංග වේ.

- පහරදීමට අදාළව වින්දිත විසින් ඔහු ගාල්ල බන්ධනාගාර ගත කිරීමේදී පොලිස් පහරදීම් පිළිබඳ ප්‍රකාශයක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, බන්ධනාගාර රෝහල වෙතින් ප්‍රතිකාර ලබා දී ඇති බවද ලේඛන අනුව කරුණු නිරීක්ෂණය වේ.

- එසේම, පොලිස් ස්ථානය විසින් පැමිණිලිකරු අධිකරණයට යොමු කිරීමට පෙර අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යොමු කර ඇත. අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව වින්දිත රෝගී ඉතිහාසය ලෙස දෑස් බැඳ දිගින් දිගට මාංචු දමා යටි පතුල් වලට ගැසූ බවත්, කොච්චි කොටා ඇස්වලට දැමූ බවත් දක්වා ඇත. අධිකරණ වෛද්‍ය වාර්තාවන්ට අනුව වින්දිතගේ පහත දැක්වෙන තුවාල ඇති බවට අධිකරණ වෛද්‍ය නිලධාරී වාර්තා කර ඇත. “දෙඅත්වල මැණික් කටුවේ සමාන්තර රේඛා ලෙස විහිදුනු පැරණි තුවාල කැළල් දෙකක්” එම තුවාල ලබා දී ඇති රෝගී ඉතිහාසය වන මාංචු දැමීම නිසා සිදු වී ඇති බවට කරුණු සනාථ වන බව අධිකරණ වෛද්‍ය වාර්තාවේ අධිකරණ වෛද්‍ය වරයා විසින් සටහන් යොදා දක්වා ඇත.

- අනුව දීර්ඝ කාලයක් මාංචු දමා තිබීමත්, පැරණි තුවාල තිබීමත් මත 2016.08.26 දින අත්අඩංගුවේ රඳවා තබා ගෙන මාංචු දමා තබා ගනිමින් තිබූ බවට සාක්ෂි සැපයීමටත් සිදු කරන බවට කරුණු නිරීක්ෂණය වේ.

<u>නීතිමය විශ්ලේෂනය</u>

<u>13 (1) ව්‍යවස්ථාව උල්ලංඝනය</u>

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (1) ව්‍යවස්ථාව පුද්ගලික නිදහස හා අපරාධ කාර්ය පටිපාටික අයිතීන් පිළිබඳ දක්වන අතර, නීතියෙන් නියම කරනු ලබන කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය, යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය.

මෙම අත්අඩංගුවට ගැනීමේදී වින්දිත වන වර්ණකුලගේ අමිල දුෂාන්ත, වාමා ශ්‍රී කාන්ති හා ප්‍රගීත් සුසංග යන අයවලුන් හේතුවක් නොදක්වා අත්අඩංගුවට ගෙන ඇති බවත්, අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට ගෙන ආ බවත්, නිවසේ කිසිවෙකුට ඒ පිළිබඳ දැනුම්දීමක් නොකළ බවට දක්වන කරුණු, වාමා ශ්‍රී කාන්ති විසින් පුත්‍රයා විසින් ලබා දුන් දිවුරුම් ප්‍රකාශය හා බුලත්සිංහල පොලිස් ස්ථානයේ යෙදූ සටහන් අනුව සනාථ වේ.

මෙම කාරණය සැලකීමේදී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 23 (1) වගන්තිය මඟින් දක්වා ඇති "යම් තැනැත්තෙකු සිරභාරයට ගැනීමේදී ඒ සිරභාරයට ගනු ලබන තැනැත්තා තමා අත්අඩංගුවට ගනු ලැබීමට වචනයෙන් හෝ ක්‍රියාවෙන් අවනත වූවහොත් මිස, අවශ්‍ය වන්නේ අතිශයින් විධිමත් අත්අඩංගුවට ගැනීමේ නෛතික කාර්යය පටිපාටියක් නොවේ. යම් අයෙකුගේ නිදහස ගමන් කිරීමේ නිදහස, සීමා වන අයුරින් අවහිර කිරීම හා පාලනය කිරීමද අපරාධ නඩු විධි විධාන සංග්‍රහයේ නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම යන්න ආර්ථයට අයත් වේ.

ඒ අනුව ඉහත තිදෙනාම කිසිදු හේතු දැන්වීමකින් කිසිදු කෙනෙකුට දැනුම්දීමකින් තොරව ගෙන ගිය බව සාක්ෂි සැපයීමක් සිදුවේ.

යම් අයෙකුගේ නිදහස අහිමි කිරීමක් පිළිබඳව 13(1) ව්‍යවස්ථාවට අයත් වේද යන්න <u>සිරිසේන සහ වෙනත් අය එදිරිව අර්නස්ට් පෙරේරා සහ වෙනත් අය</u> SCFR 14/70 නඩුවේදී දක්වා ඇත. එහිදී පුද්ගලයකු අත්අඩංගුවට ගෙන තිබේද නැද්ද යන්න රඳා පවතින්නේ අත්අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූල භාවය මත නොව ඔහු කැමති තැනක යාමට ඔහුට ඇති නිදහස අහිමි වී තිබේද යන්න මත බව දක්වා ඇත.

ඒ අනුව මෙහිදී වාමා ශ්‍රී කාන්තිට තම දරුවන්ව අනාරක්ෂිතව තැබීමට සිදුවීමක් ප්‍රගීත් සුසංගට ඔහු අකුරුදහහන් වූවෙකු ලෙස සලකා කටයුතු කරවීමට සිදු කරවීමක් තුළින් ඔවුන්ගේ සාමාන්‍ය ජන ජීවිතය මෙන්ම පවුලේ අයවලුන්ව මානසික පීඩනයක් ගෙන දෙන ආකාරයට ඔවුන්ගේ නිදහස අහිමි කිරීම තුළින් වගඋත්තර පාර්ශවය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (1) ව්‍යවස්ථාවේ උල්ලංඝනය කර ඇති බව නිගමනය කෙරේ. තවද, යම් පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමේ ප්‍රතිපාදන 1979 අපරාධ නඩු විධි විධාන සංග්‍රහයේ 32 (අ) වගන්තිය මඟින් දක්වනුයේ සාධාරණ සැකයක්, සාධාරණ තොරතුරක් හා සාධාරණ ඔත්තුවක් මත අත්අඩංගුවට ගතයුතු බවයි. නමුත් වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම් හා අනිකුත් කරුණු මඟින් පැමිණිලිකරු මුලින් අත්අඩංගුවට ගනු ලැබුවේ මිනීමැරුමකට සැකපිට බව නිරීක්ෂණය වුවද, පසුව අධිකරණයට ඉදිරිපත් කිරීමේදී එය ජීව අත්බෝම්බයක් ළඟ තබා ගැනීමක් බවට කරුණු නිරීක්ෂණය වේ. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම අත්අඩංගුවට ගැනීමට අදාළ ප්‍රතිපාදන මත සිදු කර නැති බැවින් 13(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බව කරුණු නිරීක්ෂණය වේ.

<u>13(2) ව්‍යවස්ථාව උල්ලංඝනය</u>

අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 37 වගන්තිය ප්‍රකාරව වරෙන්තුවක් නොමැතිව සිරිභාරයට ගනු ලැබූ තැනැත්තකු අවස්ථාගත සියලු කරුණු අනුව යුක්ති සහගත වන කාලයකට වඩා දීර්ඝ කාලයක් අත්අඩංගුවෙහි රඳවා තබා ගැනීම හෝ අන්ලෙසකින් රැඳවීම් කිරීම සෑම නිලධාරියෙකු විසින් නොකළයුතු අතර, ඒ කාලය සිර භාරයට ගැනීම සිදු කළ ස්ථානයේ සිට මහේස්ත්‍රාත්වරයා වෙත යාමට අවශ්‍ය කාලය අතහැර ගණන් බැලිය යුතු පැය 24 කාලය නොඉක්ම වියයුතුය. එයට දෙපාර්තමේන්තු නියෝග A-20 මෙන්ම, පොලිස්පති චක්‍රලේඛ අංක 2328/2011 හි පොලිස් අඩංගුවේ සැකකරුවන්ගේ අයිතිවාසිකම් දක්වා ඇත. පොලිස්

ව්‍යවස්ථාවේ XI හි අත්අඩංගුවට ගනු ලබන සියලුම පුද්ගලයින්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව සහතික කරන අයුරින් කටයුතු කිරීමට සියලුම ස්ථානභාර නිලධාරීන් වගකිවයුතු බව දක්වයි. එසේම එවැනි ස්ථාන අධීක්ෂණය කරන දිස්ත්‍රික් භාර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන සිටින පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව දැඩි ලෙස නිරීක්ෂණය කළයුතු බව දක්වා ඇත. වින්දිත හා ඔහු සමඟ අත්අඩංගුවට ගත් දෙදෙනා පිළිබඳ සැලකීමේදී වින්දිත දින 19 ක් පොලිස් භාරයේ රඳවා සිටි බවට සාක්ෂි සැපයීමක් සිදු වේ. එසේම, වාමා මෙන්ම ප්‍රගීත් යන අයවලුන් පැය 24 කට වැඩි කාලයක් පොලිස් භාරයේ රඳවා තබා ගෙන මහේස්ත්‍රාත්වරයකුට හෝ ඉදිරිපත් නොකර, පිටත් කර හැරීම තහවුරු වී ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට 2016.09.05 දින සිදු කළ පැමිණිල්ල හා ඒ පිළිබඳව කළ විමසීම් වලදී වින්දිත අත්අඩංගුවට ගෙන ඇති බව තහවුරු කිරීම හා එදින සිට 2016.09.13 දින දක්වා රඳවා තබා ගෙන අධිකරණයට දින 19කට පසු ඉදිරිපත් කිරීම තුළින් 13 (2) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

<u>11 ව්‍යවස්ථාව උල්ලංඝනය</u>

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අවධානය යොමු කරනුයේ වින්දිත හා ඔහු සමඟ අත්අඩංගුවට ගත් අයවලුන්ට 11 වන ව්‍යවස්ථාව මඟින් ලැබෙන මූලික අයිතිවාසිකම් කඩ වී ඇතිද යන්නයි. 11 වන ව්‍යවස්ථාවට අනුව " කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික සහ අවමන් සමගත සැළකිල්ලට හෝ දඬුවමකට යටත් නොකළ යුත්තේය."

මීට අමතරව 1994 අංක 22 දරණ වධහිංසා සහ වෙනත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකීමට ලක්වීමට එරෙහි සම්මුති පනත මඟින් දඬුවම් ආකාර වධහිංසා හෝ පුද්ගලයින්ට කෲර අමානුෂික සහ අවමන් සහගත සැළකිල්ලකට හෝ දඬුවමකට ලක් කිරීම තහනම් කරයි.

වධහිංසාව කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ල විවිධාකාර විය හැකි හා එහි ස්වභාවය එක් එක් කාරණාවලදී විවිධ විය හැකි අතර, <u>*ඇනස්ලින් ප්‍රනාන්දු එදිරිව Vs සරත් පෙරේරා හා තවත් අය හලාවත පොලිස් ස්ථානය*</u> නඩුවේදී දක්වා ඇත්තේ පොලිස් නිලධාරීන් වධහිංසාව ලක් කළ බවට සිදු කළ චෝදනාව අධිකරණ වාර්තා ලබා නොදීම මතම ප්‍රතික්ෂේප කළනොහැකි බවය.

එසේම, <u>*සිල්වා එදිරිව සභාපති, පොහොර සංස්ථාව (1989) 2 SLR 393*</u> හිදී අමරසිංහ විනිසුරු තීරණය කරන ලද්දේ 11 වන ව්‍යවස්ථාව විසින් සහතික කරන ලද සැළකිල්ල හුදෙක් ශාරීරික ප්‍රචණ්ඩත්වයට සීමා නොවිය "එමඟින් ආත්මය සහ මතය සහ විෂය පථයද අදාළ කරගනියි."

වර්තමාන සිද්ධියේදී වින්දිත අමිල දූෂාන්ත යන අයවලුන්ට කොච්චි මිරිස් දමා, ගුද මාර්ගයට බෝතල් ඇතුල් කර රඳවා ගත් මුළු කාලසීමාව තුළම මාංචු දමා පහර දුන් වධහිංසාවට ලක් කිරීම, පිළිබඳ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව වියළුනු අත්දෙකෙහි වූ තුවාල කැළැලි මඟින් සාක්ෂි සැපයීමක් කර ඇති අතරම, අධිකරණ වෛද්‍ය වරයා රෝගියා දක්වන ඉතිහාසය එම තුවාල එකඟ වන බව දක්වා ඇත.

එසේම, වාමා ශ්‍රී කාන්ති හා ප්‍රගීත් සුසංග යන අයවලුන් අතුරුදහන් වූවන් ලෙසත්, නිවැසියන්ට දැනුම්දීමකින් තොරව තම දරුවන් පිළිබඳ කුමක් වූවාද යන්න කිසිදු අදහසක් නොමැතිව මවක් ලෙස වාමා ශ්‍රී කාන්ති දින තුනක් රඳවා ගැනීමේදී ඇයට ඇති වූ මානසික පීඩනය පිළිබඳ මෙහිදී සලකා බැලිය යුතුයි. එහිදී ඇයට සිදුවූ එම මානසික පීඩාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ විෂය පථයට ඇතුළත් කළහැකි බව නිගමනය කරමු. සැකකරුවෙකු තමා අත්අඩංගුවේ තබා ඇති ස්ථානය තුළදීම අවමන් සහගත හා මිලේච්ඡ සැළකීමට ලක් කරනු ලබන සාපරාධි පොලිස් නිලධාරියකුගේ බියගුලු ක්‍රියාව තරම් මිනිසෙකුගේ හෘද සාක්ෂිය කම්පනයට පත් කරනු ලබන වෙනත් ක්‍රියාවක් නොමැති බවත්, පොලිස් දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන්ගේ එවැනි ක්‍රියාවන් පවතින නීතියට අවමන් විශ්වාසය බිඳීයාමට හේතුවක් වන බව <u>නන්දසේනගේ ලලන්ත අනුරාධ නන්දසේන එදිරිව මූලස්ථාන පොලිස් පරීක්ෂක අනුරාධපුර සහ තවත් අය SCFR 369/2013</u> නඩුවේ තීරණයේදී දක්වා ඇත.

ස්ථානාධිපති ඇතුළු වගකිවයුතු නිලධාරීන් වෙතින් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමසා සිටීම කර තිබියදී දින 19 ක් වින්දිත රඳවා තබා ගැනීමත්, පොලිස් දෙපාර්තුමේන්තු නියෝග අනුව සටහන් A-20 දක්වා ඇති ආකාරයට සටහන් නොයෙදීම මාංචු දැමීමේදී ක්‍රියා කළයුතු පිළිවෙත් අනුගමනය නොකිරීම තුළින් නීතියෙන් නියම කරනු කාර්ය පටිපාටිය උල්ලංඝනය කොට ඇති අතර, එසේම, පොලිස් අත්අඩංගුවේ පසුවන සැකකරුවන් ආරක්ෂා කළයුතු ආකාරය පොලිස්පති චක්‍රලේඛ 2328/2011 හි දක්වා ඇත. එහිදී XI අත්අඩංගුවට ගනු ලබන සියලු පුද්ගලයින්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව සහතික කරන අයුරින් කටයුතු කිරීමට සියලුම ස්ථාන භාර නිලධාරීන් වගකිවයුතුයි. එසේම එවැනි ස්ථාන අධීක්ෂණය කරන දිස්ත්‍රික්කය භාර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන සිටින පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව දැඩි ලෙස නිරීක්ෂණය කළයුතු බව දක්වා ඇත. එමඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) මඟින් සහතික කොට ඇති නීතිය යටතේ සමාන රැකවරණය වින්දිත පාර්ශවයට ලැබී නොමැත.

<u>නිගමනය :</u>

ඒ අනුව ඉහත කරුණු අනුව වින්දිත වන වර්ණකුලගේ අමිල දුෂාන්ත මයා හා පිටිගල ලියනගේ වාමා ශ්‍රී කාන්ති යන අය සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 11,13(1), 13(2) හා 12(1) ව්‍යවස්ථාවන් උල්ලංඝනය කර ඇති බව නිගමනය කරනු ලැබේ.

<u>නිර්දේශය :</u>

01. 1,2,3,4,5 සහ 6 යන වගඋත්තරකාර පාර්ශවයන් විසින් වින්දිත පාර්ශවයන් වෙත එක් අයෙකුට රු: 50,000/- ක මුදලක් ලෙස රු: 100,000/- (රු: ලක්ෂයක) මුදලක් ලබාදීමටත්,

02. වගඋත්තර පාර්ශවයන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති වෙත යොමු කිරීමටත්,

03. වගඋත්තර පාර්ශවයේ නිලයේ උසස්වීම් කටයුතුවලදී සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා පොලිස් කොමිෂන් සභාවට පිටපතක් යොමු කරනු ලැබේ.

04. වධහිංසා පනත යටතේ නඩු දැමීමට මෙහි පිටපතක් නීතිපති වෙත යොමු කරනු ලැබේ.

2021.11.26 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර, ඒ සම්බන්ධව වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය/ වින්දිත පාර්ශවය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දියයුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමි.

A Shanmuganathan

අනුෂියා ෂන්මුගනාදන්

කොමසාරිස්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි

කොමසාරිස්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

සැ.යු. : අදාළ මුදල මුදල් ඇණවුමක් මඟින් පැමිණිලිකරු වෙත යැවූ එකී පිටපතක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

වන්/-